


Dilshi Kumarasinghe (left) congratulates Nadeesha Ramanayake after the latter won the women's 400 metres. (Pix by Kamal Wanniarachchi)

Rajitha Rajakaruna (right) and Aruna Dharshana (left) finished second and third respectively in the men's 400 metres.



# ක්‍රීඩාව හා ව්‍යවසායකත්වය

**සුසංවේද 2021-බුද්ධි කලම්බන දෙවනසැසිය,2021/02/26**

"…..නිශ්චිත පාලන සංවිධානයක් ඇති නීතිරීති හෝ මිනිස් හැසිරීම් අරමුනු සහ සීමා සිරිත් පිළිබඳ ඓතිහාසික පසුබිමක් ඇති ශාරීරික පසු තලයක් මත අවසන් ප්‍රතිපල ය නිශ්වය කෙරෙන අභියෝග සහිත ක්‍රියා ලෙස ක්‍රීඩාව අර්ථදැක්වේ……"

# ක්‍රීඩාව සහ ව්‍යවසායකත්වය

**සාරාංශය**

ක්‍රීඩාව මානවයාට පමණක් උරුම ක්‍රියාකාරමක් නොවේ. එය සත්ව ලෝකයේ ද දැකගත හැකි පොදු ස්වභාවික ක්‍රියාකාරකමකි. සත්වයෝ ශාරීරික වර්ධනය, යෞවනය, ජවය නොනැසී පවත්වාගෙන යාම සහ සහකරුවාගේ ආකර්ෂණය දිනාගැනීම උදෙසා විවිධ ප්‍රදර්ශනාත්මක ක්‍රීඩාවන් හි නිරතවෙති. චාල්ස් ඩාවින්ගේ පරිණාම න්‍යායට අනුව එය ශක්තිවන්තයාගේ නො නැසී පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ස්වභාවික ක්‍රියාකාරකමකි. මානව සමාජයේ මුල් යුගයේ ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිළි චිත්‍රයක් දැනට ශේෂව පවතින වසර 60,000 ක් පමණ පැරණි ඕස්ට්‍රේලියානු ඇබොරිජන් Aborigine ආදිතමයන් නිර්මාණය කළ ගුහා චිත්‍ර සහ දකුණු අප්‍රිකාවේ වසර 30,000-12,000 පැරණි සැන් (බුෂ්මන්) San (Bushman)[1] ගෝත්‍රිකයන්ගේ ගුහා චිත්‍ර මගින් අවබෝධ කර ගත හැක. මෙතෙක් මානවයා පසු කළ සෑම ශිෂ්ටාචාරයකම එවැනි සටහන් ශේෂව පැවතීමෙන් ක්‍රීඩාව මානව සමාජයේ යහපැවැත්මට අත්‍යවශ්‍ය අංගයක් යැයි නිගමනය කළ හැක.

සම්භාව්‍ය ග්‍රීසියේ සහ රෝමයේ පුද්ගල පෞරුෂත්වය උද්දීපනය කරන ප්‍රධාන සාධකය වූයේ අධ්‍යාපන යයි. ක්‍රි. පූ. පස්වන සියවස වන විට අධ්‍යාපනය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංගයකි. හෙලනිකා යුගයේ ග්‍රීක සංස්කෘතියේ අත්‍යවශ්‍ය ශික්ෂණය සඳහා බුද්ධිමය සහ තාරුණ්‍යයේ ජවය ශාරීරික අධ්‍යාපනය ප්‍රදානය කළ අතර, ශාරීරික වර්ධනය සඳහා ජිම්නාසියම් Gymnasium[2] පාසල තාරුණ්‍යයේ ආකර්ෂණය දිනාගත් සුවිශේෂී ස්ථානයකි. ශාරීරික අධ්‍යාපනය (Gumnastike) ශක්තිය, ජවය, වේගය, දරාගැනීමේ බලය (සහිෂ්ණුතා බලය Stamina) එකල පෞර රාජ්‍යයේ විසූ ඇතීනියානුවාගේ පැවැත්මට අත්‍යවශ්‍ය දෛනික දිවියේ මූලිකාංගයකි. පෙරදිග භාරතීය සංස්කෘතියේ මානසික සහ ශාරීරික ඒකාග්‍රතාව (ශික්ෂණය) සඳහා ක්‍රිඩාව උපයෝගි කරගත් වග දක්නට ලැබේ. ක්‍රි. පූර්ව දෙවන සියවසේ දී පතාංජලීගේ යෝගා ව්‍යායාම ආශ්‍රමවාසී ශ්‍රමනයාගේ මෙන්ම ගෘහවාසී ගිහියාගේ පෞරුෂවර්ධනය සඳහා යොදා ගත්තේය. දුනු ශිල්පය, මල්ලව පොර වැනි ක්‍රීඩා ගැන ද ඉතිහාසයේ සඳහන් වේ. සහකාරියක තෝරා ගැනීමේ දී (ස්වයංවරය) ක්‍රීඩා කෞශල්‍යය තරුණයකු සතු ඉතා උසස් සුදුසුකමකි. චීනය, ජපානය සහ කොරියාව ශ්‍රමණාශ්‍රම තුළ ආත්මාරක්ෂක සටන් ක්‍රම අඛණ්ඩව පවත්වාගෙන යාමෙන් සමාජ ශික්ෂණය සඳහා ක්‍රිඩාව භාවිත කළ බව දක්නට ලැබේ.

ප්ලේටෝට අනුව අධ්‍යාපනය දේශපාලන මෙහෙවරකි. එහෙයින් හෙතෙම සංවාදයේ දී ක්‍රීඩාව තරුණ අධ්‍යාපනයේ ශික්ෂණ මාර්ගයක් යැයි සටහන් කළේය. අධ්‍යාපනයේ සෑම මානයක්ම සද්ගුණය වර්ධනයට යොමුකළ යුතු යැයි හෙතෙම අවධාරණය කළේය. යමෙකු සතු ස්වශක්තිය සහ ධෛර්ය ප්‍රදර්ශනයවන්නේ ක්‍රීඩාවෙන් යැයි එකල පිළිගත් පොදු මතයකි. ප්ලේටෝගේ ඇකඩමි[3] අධ්‍යාපනයේ දී සෑම සිසුවෙක්ම එක් හෝ බහුවිධ ක්‍රිඩා ක්‍රියාකාරකමක් තෝරාගත යුතුය. එමෙන්ම හෙතෙම දෛනික දිවියේ විවිධ ගැටලුවලට පිළිතුරු සැපයීමේ දී නිදර්ශන ලෙස ක්‍රීඩා ඉසවු තොරා ගත්තේය. ළමාවියේ දී ම ක්‍රිඩාව සහ සංගීතය මගින් ලබන අධ්‍යාපනය සමාජ සාධාරණය විනිෂ්චය සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි යැයි හෙතෙම විශ්වාස කළේය. ඇරිස්ටෝටල් සිය අධ්‍යාපනයේ දී මනස සහ සිරුරේ සමබරතාව පවත්වාගෙන සංතෘෂ්ටිය සොයායාමේ ශික්ෂණ මාර්ගයක් ලෙස ක්‍රීඩාව හැඳින්වීය. එහෙයින් ක්‍රීඩාව සමස්ථ මානව අධ්‍යාපනයේ අතිශයින්ම වැදගත් අංගයකි.ගෝලීය ක්‍රීඩා ආචාරධර්ම deontology යන නාමයෙන් හැඳින් වේ. deon නමැති වදනේ ග්‍රීක අරුත රාජකාරිය යන්නයි. නිවැරදි අරුත සද්ක්‍රියාවේ මූලධර්ම යයි. එනම් අනෙකා සමග සිදුකරන යහපත් මානුෂික සහසබඳතාව යැයි ජර්මානු දාර්ශනික එම්මානුවෙල් කාන්ට් අර්ථකථනය කළේය. ක්‍රීඩාව ව්‍යවසායකත්වය සඳහා භාවිතකිරීමේ දී උක්ත ආචාර ධර්ම මත ස්ථිරසාරව පිහිටීම අතිශයින්ම වැදගත්ය.

[1] Anne Solomon, San rock arts, David Phillip Publication 1998, South Africa
[2] Classical Athens (508–322 BCE) Old Education in classical Athens consisted of two major parts – physical and intellectual.
[3] Will Durant, The Story of Philosophy, The Lives and Opinions of the Great Philosophers,1961 , The poket Books 2006

පටුන

1.හැඳින්වීම.......................................................................................... 4

2.ක්‍රීඩාව තුලින් සේවා නියුක්තිය හා ව්‍යවසායකත්වය සඳහා යෝජිත ප්‍රවේශයන්..... 6

3.ක්‍රීඩාව ආශ්‍රිත රැකියා..................................................................................... 9

4.PESTEL විශ්ලේෂණය..................................................................................... 10

5.ගැටළු හා යෝජනා......................................................................................... 14

6. උපායමාර්ග හා යෝජිත කාර්යයන්....................................................................... 18

7.සුසංවේද - 2021 විද්වත් කමිටුව........................................................................ 23

8. රාජ්‍ය අංශය නියෝජනය කරුණු ලබන නිලධාරීන්............................................ 23

9.සහභාගීත්වය.................................................................................................. 23

# ක්‍රීඩාව සහ ව්‍යවසායකත්වය

**1.හැඳින්වීම**

නිශ්චිත පාලන සංවිධානයක් ඇති නීතිරීති හෝ මිනිස් හැසිරීම් අරමුණු සහ සීමා සිරිත් පිළිබඳ ඓතිහාසික පසුබිමක් ඇති ශාරීරික පසු තලයක් මත අවසන් ප්‍රතිපල ය නිශ්චය කෙරෙන අභියෝග සහිත ක්‍රියා ලෙස ක්‍රීඩාව අර්ථ දැක්වේ.

ක්‍රීඩාවේ නිරත වීමෙන් විවිධ ප්‍රතිලාභ ලබාගත හැකි බව අතීතයේ මෙන්ම වර්තමානයේත් ලෝකයම දැනසිටී. දැඩි චිත්ත වේග පාලනය කිරීමත්, නොදැමුණු ගති මැඩ පැවැත්වීමටත්, තම කෞෂල්‍යයන් ප්‍රදර්ශනය කිරීමත්, ඒවා තුලින් ප්‍රේක්ෂකයන් කුල්මත් කිරීමත්, ක්‍රීඩාවන් කිරිමට නොහැකි අයට ඒවා නැරඹීමෙන් ක්‍රීඩා කිරිමට නොහැකිවීමෙන් ඇතිවන අඩුපාඩුව මගහැර ගැනීමටත් යන කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇත.

අතීතයේදී වර්තමානයේදී මෙන් ක්‍රීඩාව සම්බන්ධයෙන් අවධානයක් නොමැතිවිය. එහෙත් ජීවිතයේ පැවති අත්‍යවශ්‍ය කාර්යයන් වල ඔවුන් ක්‍රියාශීලිව නිරත විය. පසුව එම ක්‍රියාවන් විවිධ ක්‍රීඩාවන් බවට පරිවර්තනය විය. ක්‍රීඩාවේ ඉතිහාසය සලකන විට ග්‍රීසිය, රෝමය, ඊජිප්තුව,ක්‍රීටය, ඉන්දියාව, ජපානය, ශ්‍රී ලංකාව වැනි රටවල විවිධ ඉසව් සම්බන්ධ තොරතුරු පවතී. ඔලිම්පික් උලෙළ ක්‍රි.පූ 1370 සිට 9 වන සියවස තෙක් පවත්වා ඇති බවට සාක්ෂ්‍ය ඇත.බොහෝවිට ධනවත් පංතියේ අවශ්‍යතාවයක් පිණිස මෙය භාවිතා කර ඇත. පැවැත්වූ ක්‍රීඩාවන් ලෙස බොක්සින්, පංච ශිල්ප, කරත්ත තරඟ, අශ්ව තරඟ, අවි සහිත තරඟ, චිත්‍ර තරඟ, ජිම්නාස්ටික් හා මලළ ක්‍රීඩාවන් වේ. මින් මළල ක්‍රීඩාවට මුල් තැනක් ලැබිනි.

මහා භාරතය, රාමායනය යන ග්‍රන්ථ තුල මෙවැනි ක්‍රීඩා පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. දඩයම් ක්‍රීඩා, යුධ කටයුතු සඳහා තරුණයන් යෙදවීම සඳහා පොළඹන වන සුළු ක්‍රීඩා පවත්වා ඇත. බුද්ධ කාලීන සමාජය පිළිබඳව අවධානය යොමු කරන විට සිදුහත් කුමරා යසෝදරා කුමරිය විවාහ කරගැනීම සඳහාද සරඹ ක්‍රීඩා උළෙලක් පවත්වා ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ උපතට පෙර කාලයේදී ඉන්දියාවේ අශ්වයන් පිටයෑම, තුරඟ තරඟ දියුණු මට්ටමක තිබී ඇත. ඊට අමතරව යෝග ව්‍යායාම්, ශාරීරික ව්‍යායාම් වැනි දෑ බහුල වශයෙන් ඉන්දියාවේ පැවත ඇත.

ශ්‍රී ලංකාව ගත්විට අන් ශිෂ්ඨාචාර මෙන්ම පිනුම් ගැසීම, පැනීම, මල්ලව පොර , අසුන්පිට නැග සටන් කිරීම, දුනු ශිල්පය, අංගම් පොර,ජල ක්‍රීඩා සහ වෙනත් ජන ක්‍රීඩා පැවතින. පසු කාලීනව විශේෂයෙන් අධිරාජ්‍යවාදී පාලනයත් සමග වෙනස්වී ඇති අතර අපරදිග ක්‍රීඩා හා මිශ්‍ර විමක්ද සිදුවී ඇත. ප්‍රදේශයක ඇති භෞතික ස්වරූපයට අනුව, අවශ්‍යතාවයට අනුව රටින් රටට ක්‍රීඩාවේ ස්වරූපයන් නිර්මාණය වි ඇත. ඊට අමතරව ක්‍රීඩාවේ පැවති ස්වරූපය,ක්‍රමය, වේගය, අරමුණු, ත්‍යාග පිරිනමන ආකාරයන් වර්තමානය වනවිට සමාජ අරමුණුත් සමග නවීකරණය වී ඇත.

**ක්‍රීඩාව රටකට වැදගත් වන්නේ ඇයි?**

ක්‍රීඩාව තුලින් ලැබෙන කායික නිරෝගී බව පුද්ගලයකුගේ මානසික වර්ධනය කෙරෙහි අතිශයින් බලපායි. මනසෙහි ඇතිවන ප්‍රසන්න බව මිනිසාගේ දෛනික කටයුතු කරගෙන යාමට රුකුල්දෙයි. ක්‍රීඩාවෙහිදී මානසික ඒකාග්‍රතාවයක් තිබිය යුතුවාක් මෙන්ම, ධෛර්යය, ආත්ම ශක්තිය හා ඉවසීමද ඒ හරහා පුරුදු පුහුණු වීමට අවස්ථාව සැලසෙයි. ක්‍රීඩා කරන්නා ජයග්‍රහනයේදී උද්යෝගීමත් වන අතරම පරාජයේදී කම්පා නොවේ. පරාජිතයා ගැරහීමට ලක් නොකරයි. අවසානය දක්වාම එනම් ජයග්‍රහනය තෙක් කැපවෙයි. ක්‍රීඩා පිටියේදී ලබාගන්නා මෙවැනි අත්දැකීම් සාමාන්‍ය ජීවිතයේදි ප්‍රගුණ විමෙන් මනා පෞරුෂයකින් හෙබි යහපත් පුරවැසියන් පිරිසක් බිහිවීමට හේතුවේ. එවැනි පුරවැසියන් අතර ක්ෂණික කෝපය , ඊර්ෂ්‍යාව, අන්මත නොඉවසීම වැනි සමාජයට හානිකර ආකල්ප ඇති නොවේ. එවැනි පුරවැසියන් කණ්ඩායමක් සමාජයට එකතුවීම රටට ආදර්ශයකි.

ලෝකයේ සෑම රටක්ම ක්‍රීඩාව උදෙසා විශාල මුදල් සම්භාරයක් වියදම් කරන්නේ ක්‍රීඩාව මගින් පුද්ගල සංවර්ධනයෙන් ඔබ්බට ගොස් රටකට ජාත්‍යන්තරය ජයගැනීමේ අවස්ථාවක් බවටද පත්ව ඇති බැවිනි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව 1996 ලෝක කුසලානය ක්‍රිකට් තරඟාවලිය ජයග්‍රහනය කිරීමත් සමගම අපරටට බොහෝ දොරගුළු විවෘත විය.

**ව්‍යවසායකත්වය**

ව්‍යවසායකත්වය යනු කෙටියෙන් කිවහොත් ලාබ උපයන අදහසින් ව්‍යාපාරයක් නිර්මාණය කර ගැනීමයි. ක්‍රීඩාව සැලකූකල ලෝකය තුල ඉතා ජනප්‍රිය ක්‍රීඩාවන් රාශියක් දක්නට ඇත. ඒ සඳහා විශාල ජනකායක් එක් රොක්වී සිටින බව අපට දැකගත හැක. වර්තමානය වන විට විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල දියුනුව නිසා ඉතා විශාල ජන රාශියකට ලෝකයේ එක් තැනක පවත්වන ක්‍රීඩාවක් විකාශනය කල හැක. ඒ හා බැඳුනු විශාල ව්‍යාපාරයන් ගණනාවක් පවතින අතර එයට තවත් ක්ෂේත්‍ර ගණනාවක්ම එක් කිරීමේ හැකියාවද පවතී.

ශ්‍රී ලංකාව සැලකූකල රටේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාව හා ව්‍යවසායකත්වය යොදාගන්නේ කෙසේදැයි යන්න අද ගැඹුරින් සාකච්ඡා කිරීමේ ප්‍රවේශයකට අප එළඹ ඇත.

## 2.ක්‍රීඩාව තුලින් සේවා නියුක්තිය හා ව්‍යවසායකත්වය සඳහා යෝජිත ප්‍රවේශයන්

### 01.කායවර්ධන මධ්‍යස්ථාන /මධ්‍යස්ථාන කළමණාකරුවන්

දේහයේ හැඩය(තරුණ) නිසි ආකාරව පවත්වා ගැනීම ට සාමාන්‍ය මානවයා කැමැත්තක් දක්වයි. එය තමාගේ ආකර්ශනීය බව පිළිබඳව හා සෞඛ්‍යය හා තිරව පවත්වා ගැනීම (ඉරියව්) සඳහා පහසුවක් සපයයි. කායවර්ධන මධ්‍යස්ථාන මගින් මෙම අවශ්‍යතාව ක්‍රමානුකූලව සපුරා දිය හැකිය. මෙහිදි විධිමත් පුහුණුවක් සහිත පුහුණුකරුවන්, විධිමත් පුහුණුවක් සහිත පෝෂණවෙදීන් හා ඖෂධවේදීන් අවශ්‍යවේ. එසේම පුහුණු උපකරණ නඩත්තු හා අළුත්වැඩියා සිදුකරන ශ්‍රමිකයින් සඳහාද රැකියා අවස්ථා උදාවේ.

### 02. ක්‍රීඩා උපාංග

ක්‍රීඩා සඳහා සම්මත ක්‍රීඩා භාණ්ඩ අත්‍යවශ්‍යවේ. මෙහිදී ප්‍රධාන ක්‍රීඩා භාණ්ඩයට/ භාණ්ඩවලට අමතරව පුද්ගලයන් විසින් පළඳිනු ලබන උපාංගයන් ද වෙළඳාම සිදුවේ. එහිදී අනතුරු වලකන උපකරණ ප්‍රධාන තැනක් ගනී. එසේම ක්‍රීඩා විනිශ්චය සඳහා භාවිතා කරන උපකරණයන්ද පවතී. එසේ එක් එක් ක්‍රිඩක ක්‍රීඩිකාවන් භාවිතාකරන අත්‍යවශ්‍ය නොවන නමුත් අලංකාරය සඳහා භාවිතා කරන උපාංගයන් ද පවතී. එක් එක් ක්‍රීඩාව අනුව ඒවා ලැයිස්තුගත කළ යුතුය. එසේ ක්‍රීඩා උපකරණ හා අනෙකුත් උපාංග විවිධ ගුණත්වයක් සමග හා විවිධ මිල ගණන් පරාසයන් යටතේ විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා සපයනු ලැබේ. මෙහි ප්‍රධාන වශයෙන් කුඩා ළමයින් සඳහා, පාසල් සිසුන් සඳහා සහ ජාතික සහ ප්‍රදේශීය මට්ටමේ ක්‍රීඩකයින් සඳහා සහ විනිශ්චය සඳහා සහභාගිවන පුද්ගලයින් සඳහා වශයෙන් ද, ක්‍රීඩා තම විනෝදාස්වාදය හා ජීවන මට්ටම පවත්වා ගැනීමට යොදා ගනු ලබන පුද්ගලයින් සඳහා වශයෙන් කොටස් කර දැක්විය හැකිය.

### 03.යෝග හා ආයුර්වේද

යෝග ක්‍රමද ක්‍රීඩාවන් වශයෙන් හා ශරීර සුවතා ක්‍රමවේදයක් ලෙස භාවිතාවේ. එසේම යෝග ක්‍රිඩකයින් ගේ නම්‍යතාවය හා දරා ගැනීමේ හැකියාව , රෝග නිවාරණය , අනතුරු වලින් ඉක්මන් සුවය හා සිදුවිය හැකි අනතුරු වලින් හා අතුරු විපාක වැලැක්වීමේ ක්‍රමවේදය ලෙස යොදා හැකිය. මෙම යෝග ක්‍රම එක තැන සිටින ක්‍රියාවන් සඳහාද යොදා ගත හැක. එසේම එය මානසික ඒකාග්‍රතාවය හා සමවත් සුවය දියුනු කර පරිපූර්න ක්‍රීඩකයකු සකස් කිරීම සඳහා සාර්ථකව යොදා ගත හැකිය. යෝග උපදේශකයන් වශයෙන් සුදුසු පුද්ගලයන් පුහුණු කිරීම මගින් පාසල් මට්ටමේ සිට යෝග අධ්‍යාපනය හා සංවර්ධන ක්‍රියාවලිය ගොඩනැගිය හැකි අතර එමගින් විශාල පිරිසකට රැකියා අවස්ථා උදාවේ. එනම් එය ගුරු විද්‍යාල මට්ටමින් ඩිප්ලෝමා පාඨමාලාවන් ලෙසද ඇරඹිය හැකිය.

එසේම ආයුර්වේදය සාර්ථකව ක්‍රීඩාවේ කාර්යක්ෂමතාවය, අනතුරු හා අතුරු ආබාධ නිවාරණය ද එමෙන්ම අනතුරුවලින් ඉක්මන් සුවය සඳහාද යොදා ගත හැක. එමගින් මානසික ඒකාග්‍රතාවය හා සමබරතාවයද, දරාගැනීමේ හැකියාවන්ද වර්ධනය කලහැක. ආයුර්වේද ක්‍රම මගින් සාමාන්‍ය ක්‍රම වලට වඩා කාර්යක්ෂමව ක්‍රීඩාවේ සිදුවූ අනතුරු හෝ දෝෂ ඉක්මනින් සමනය කලහැකිය. මෙමගින්

විදේශ වෙළඳපලට පිවිසීමට හැකිය. විදේශ ක්‍රීඩකයන් සඳහාද සේවා සැපයිමෙන් විදේශ විනිමය ඉපයිය හැක. එසේම ආයුර්වේදය මගින් නිර්දේශිත අනුකූල ආහාර පිළිබඳ උපදේශනය හා ආහාර ලබාදීම මගින් රැකියා අවස්ථා නිර්මානය වේ.

## 04.භෞතචිකිත්සකයින්

සාමාන්‍ය චලන ක්‍රීඩා සඳහා භෞතචිකිත්සකයින් අනිවාර්යයෙන්ම අවශ්‍යවේ. ලංකාවේ නිසිපරිදි පුහුණු භෞතචිකිත්සකයින් සංඛ්‍යාව සීමිතවේ. එක් එක් ක්‍රීඩාවට අදාල භෞතචිකිත්සකයින් සංඛ්‍යාව අධ්‍යයනය කලයුතු අතර අදාල බලධාරීන් හා එක්ව ජාතික අවශ්‍යතාවය පිලිබඳ තීරණ ගත යුතු අතර එ සඳහා ක්‍රමෝපායන් දියත් කලයුතුය. මේ පිළිබඳ විධිමත් පුහුණුවක් තරුණ ප්‍රජාව වෙත ලබා දීමෙන් විධිමත්ව රැකියා ජනිත කලහැකි බව නිරීක්ෂණය වේ. එසේම මෙය ආයුර්වේද වෛද්‍ය තාක්ෂණය මත පදනම්ව ද සිදුකලහැක. එමගින් නව මානයක රැකියා ජනිත වේ.

## 05. පිටි සැකසුම්කරු

ක්‍රිකට්, පාපන්දු වැනි ක්‍රීඩා  සඳහාද ටෙනිස් , බැඩ්මින්ටන්, පැසිපන්දු, දැල් පන්දු වැනි ක්‍රීඩා සඳහා කෘතිම හා ස්වාභාවික පිටි භාවිතා වේ. මේවා සකස් කිරීම හා නඩත්තුව ක්‍රමාණුකූලව ජාත්‍යන්තර තත්ත්ව යටතේ සිදුකලයුතුය. මේ සකස් කරන අමුද්‍රව්‍යයන් නිසි පරිදි තෝරාගත යුතුය. එසේ ජලසම්පාදනය ආදිය දැඩි පරිශ්‍රමයක් යොදා සිදුකල යුතුය. එසේ පිටි  සැකසීම හෝ එහි අමු ද්‍රව්‍ය වල ගැටළු හේතුවෙන් ක්‍රීඩකයින් හට අනතුරු සිදුවීමේ තත්වයක් උදාවිය හැකිය. මෙම තත්වයන් මගහැරීමට කිරීමට පුහුණුවලත් ක්‍රීඩා පිටි සකසන්නන්/ නඩත්තු කරුවන් අවශ්‍ය වේ.

ක්‍රීඩාව දියුණුකිරීමේදි ප්‍රදේශීය වශයෙන්  මෙම සහය අත්‍යවශ්‍ය වේ. ප්‍රාදේශීය ක්‍රීඩාපිටි වල ජාත්‍යන්තර මට්ටමේ නිර්ණායක අනුව පුහුණු පිටිසැකසුම් කරුවන් අතින් නඩත්තු වන්නේ නම් සියළුම ක්‍රීඩකයන් අගනුවරට සැමවිටම පැමිණීමේ අවශ්‍යතාවයක් නැතිවී යන අතර අමතර රැකියා ප්‍රාදේශීයව ජනිත වේ.

## 06.පෝෂණවේදීන්/ආයුර්වේද

පෝෂණවේදීන් ක්‍රීඩාවන් සම්බන්ධයෙන් සැලකූකල වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. එක් එක් ක්‍රීඩාවට අනුව සිදුවන ක්‍රියාකාරකම් හා ඒ සඳහා යොදවන, වැයවන ශක්තිය නැවත ලබාගැනීම නැතහොත් ඒ ඒ ක්‍රීඩාවේදී ශරීරයේ විභවය උපරිම තලයකට ගෙන ආ හැක්කේ  අදාල පෝෂක සංඝටක ශරීරයට ලබා ගැනීමේදී ය. මේ සඳහා අධ්‍යයනයන් කලයුත්තේ විශේෂඥ දැනුම සහිත පුද්ගලයන් සහභාගිත්වයෙනි. එක් එක් ක්‍රීඩාව සඳහා විශේෂිතවූ පෝෂණවේදීන් සැම ක්‍රීඩා කණ්ඩායමක් සඳහා ද සිටිනම් ක්‍රීඩාවේ තත්ත්වය ගුණාත්මක වන අතර එමගින් ජනිතවන රැකියා අවස්ථාවන්ද සැලකිය යුතු ප්‍රමාණයකි. මෙය ක්‍රීඩා වෛද්‍යවිද්‍යා ක්ෂේත්‍රය යටතේ හැදැරිය යුත්තකි.

ශ්‍රී ලංකාවේ පෝෂණවේදය සැලකූ විට ප්‍රධාන පද්ධතින් දෙකක් වේ. එනම් බටහිර වෛද්‍ය ක්‍රමය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවට අනුව සිදුකරන පෝෂණවේදයට අදාල උපදේශනයන් හා පෙරදිග එනම් දේශීය ඥාන පද්ධතියට අනුකූලව මානව විභවයන්, දරාගැනීමේ ශක්තියත් දියුණුකිරීමට හැකි මානව සම්පතයි. මෙහි ආයුර්වේදයට අදාල යොදාගැනීම් පිළිබඳව අධ්‍යයනයන් හා පර්යේෂණ ආරම්භ කල යුතුය. චීනය සිය දේශීය දැනුම සියළුම ක්‍රීඩාවන් සඳහා වාගේ යොදාගනිමින් පවතී.

### 07.සටන් කලාව(අංගම් සටන්)

තරුණ ප්‍රජාව උද්වේගය කෙරෙහි දැඩි ආකර්ශනයක් දක්වයි. මේ අනුව විවිධ සටන් ක්‍රම හැදෑරීම පිළිබඳව දැඩි ඇල්මක් ඇත. මේ අනුව ජාත්‍යන්තර සබඳතා ද යොදා ගනිමින් චීන,ජපන්,කොරියානු ආදි සටන් වල ක්‍රීඩා සඳහා යොදගතහැකි ශෛලීන් පිළිබඳ පුහුණු කරුවන්, ඇඳුම්, සටන් උපකරණ සකස්කරන්නන් සඳහා රැකියා අවස්ථා උදාකරගත හැක. මේ සඳහා පුළුල් රාජ්‍ය මැදිහත් වීමක් අවශ්‍ය වන අතර එම ක්‍රීඩා නියාමනය හා ක්‍රීඩකයින් ශ්‍රේණිගත කිරීම හා ජාතික මට්ටමේ තරඟාවලි නොකඩවා පැවැත්වීම අත්‍යවශ්‍ය වේ.

එසේම දේශීය සටන් කලාවේ විවිධ ශෛලීන් ද මේවනවිට සමාජ ගත වි ඇත. නිවැරදිව මෙම ශිල්පක්‍රම එනම් අංගම් සටන් ශිල්ප ක්‍රම අධ්‍යාපන මධ්‍යස්ථාන ඇතිකිරීම එම ශිල්පීන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවේදයන් ඇති කිරීම, ප්‍රදර්ශන කණ්ඩායම් ඇති කිරීම, විවිධ අවස්ථා සඳහා ප්‍රදර්ශන කණ්ඩායම් ආර්ථික පිරිවැය අයකර ගැනීමේ ක්‍රම වේදයන් සමග යෙදවීම. එයින් රැකියා අවස්ථා බිහිකර ගත හැකි අතර දේශියත්වය හා තාක්ෂණය ආරක්ෂා කර ගත හැක. එසේම අංගම් සටන් ආශ්‍රිත ව්‍යයාම ක්‍රම පුළුල් සමාජයට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය කර ගැනීමෙන් අංගම් සටන් ක්‍රම ආශ්‍රිත ව්‍යායාම ක්‍රම සහ ඒ පිළිබඳ පුහුණුකරුවන්ට වෙළඳපල ඉල්ලුමක් නිර්මාණය කල හැකිවේ.

අංගම් සටන් කලාව/ශිල්ප සංචාරකයන් ආකර්ශනය කර ගැනීම සඳහා යොදා ගතහැකි ප්‍රදර්ශන අංගයක් ලෙස දියුණු කිරීමෙන් ප්‍රදේශයට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ උපාය මාර්ගයක් ඇතිවේ.

### 08.ක්‍රීඩා උපාංග/ඇඳුම්

මෙය පර්යේෂණය කලයුතු ක්ෂේත්‍රයකි.විවිධ ක්‍රීඩා සිදුකරන අතර පැළඳිය හැකි ඖෂධ ගල්වන ලද උපාංග මගින් ආබාධ අවම කිරීම හා දුෂ්කරතා මග හැරීම සඳහා ක්‍රියා කලහැකි බවට මතයක් පවතී.

මේ පිළිබඳ දේශීය වෛද්‍ය අංශයේ විශේෂඥයන් හා ක්‍රීඩා උපදේශකයන් අතර කතිකාවක් ඇති කිරීම මගින් විවිධ ව්‍යවසායකයින් සඳහා වෙළඳපල නිර්මාණය කල හැකිය.

උදා:-ඖෂධීය තෙල් ගැල්වූ වෙළුම් පටි.

### 09.උප කොන්ත්‍රාත්තු

වැඩි ඉල්ලුමක් පවතින හා අඩු පිරිවැයකින් නිපදවිය හැකි ක්‍රීඩා ඇඳුම් හා අධික වෙළඳපල වටිනාකමකින් මිලකලහැකි ක්‍රීඩා ඇඳුම් හා ආශ්‍රිත පැලඳුම් කුඩා පරිමාන ව්‍යවසායකයින් මගින්

නිෂ්පාදනයට ඇති අවස්ථාව සොයා බැලීම වැදගත්වේ. මෙම උපකරණ buy back system යටතේ ප්‍රධාන ආයතනයන් මගින් කුඩා පරිමාන ඒකකයක් සමග උපකොන්ත්‍රාත් ලබාදීම මගින් සිදුකිරීමට හැකියාව සොයා බැලීම වැදගත්වේ.

**10.සමාගම් අනුග්‍රාහකත්වය**

විවිධ ක්‍රීඩකයන් මධ්‍ය හා මහා පරිමාන ආයතනය සඳහා ඇතුලත් කරගැනීම මගින් ඔවුන්ගේ අදහස් හා ක්‍රියාමාර්ග මගින් ආයතනයේ අනෙකුත් ප්‍රජාව අභිප්‍රේරනය කර කණ්ඩායම් හැඟීම් ඉහල නැංවීම සිදුකළ හැකිය.

**11.වෘත්තීය ක්‍රීඩකයින් බිහිකිරීම**

වර්තමානයේ ක්‍රීඩකයන් බොහෝ දෙනෙකු වෙනත් ආධාරක රැකියාවන්හි නිරතවෙමින් සිය ක්‍රීඩා කටයුතු සිදුකරයි. ක්‍රීඩා සංගම් හා සම්මේලන නිසි පරිදි නියාමනය මගින් ක්‍රීඩකයන් සඳහා නිසි ඉල්ලුමක් ජනනය කල හැකිය. එසේම ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම හා වෙළඳ ප්‍රචාරනය හා සන්නාම ප්‍රචාරනය මගින්ද වෘත්තීයමය ක්‍රීඩකයන් බිහිකිරීමට පදනම සැකසේ. වර්තමානයේ ප්‍රධාන වශයෙන් ත්‍රිවිධ හමුදා ආශ්‍රිතව පූර්ණ කාලීන වෘත්තීයමය ක්‍රීඩකයන් සඳහා අවස්ථාව පවතී.

12.ක්‍රීඩා චිකිත්සාව (Sports Therapy)

ආතතිය මුදාහැරීමේ එක් මාර්ගයක් ලෙස Sports Therapy හැඳින්විය හැක. විවිධ ආතති තත්වයන් සහිතව ජීවත්වීම පුද්ගලයින්හට සමාජීය මෙන්ම සෞඛ්‍යමය වශයෙන් හානිකර වේ. එබැවින් එම තත්ත්වයන් නිවැරදිව හඳුනා ගෙන (Sports Therapy) භාවිතා කර යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ඇතිකර ගැනීමට මෙම ක්‍රමය භාවිතා කරයි.

**3. ක්‍රීඩාව ආශ්‍රිත රැකියා**

- Sports Development Officer පාසල්, ක්‍රීඩා සමාජ,පෞද්ගලික ආයතනවල
- ක්‍රීඩා හා යෝග්‍යතා උපදේශනය
- ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්
- ක්‍රීඩා භෞත චිකිත්සකයින්
- ක්‍රීඩාව ආශ්‍රිත වෘත්තීය නීතිඥවරයන්
  තරහ කොන්දේසි, තරග ගිවිසුම් හා විවිධ ගෙවීම් ආදි කටයුතු හා තහනම් ශරීර උත්තේජක වැනි ගැටළු සඳහා වෘත්තීය නිතිඥවරුන් අවශ්‍යවේ
- GYM Manager ව්‍යායාම මධ්‍යස්ථාන කළමනාකරු
- ක්‍රීඩා මනෝචිකිත්සකයින්

- වෛද්‍ය සහකරුවන්
- සම්භාහන ශිල්පීන්

**ක්‍රීඩාංගන ආශ්‍රිත රැකියා**

- ප්‍රවේශ පත්‍ර නිකුතුව පාලනය කරන්නන්/කළමනාකරුවන්
- ලකුණු පුවරු හසුරුවන්නන්
- ක්‍රීඩා උපකරණ කලමනාකරුවන්
- ක්‍රීඩා උපකරණ ගබඩා කලමනාකරුවන්
- ක්‍රීඩා විනිශ්චය කරුවන් හා තීරකයන්

**ක්‍රීඩාව ආශ්‍රිත මාධ්‍ය අංශයේ රැකියා**

- ක්‍රීඩා මාධ්‍යවේදිය
- ක්‍රීඩා ඡායාරූප ශිල්පීන්(වෘත්තීන්)
- ක්‍රීඩා තීරු ලිපි සකස් කරන්නන්
- ක්‍රීඩා අලෙවිකරණය(සමාජජාලා ශිල්පීන්)
- ක්‍රීඩා මාධ්‍ය සන්දර්ශන කථා පහසුකරුවන්(Host)
- ක්‍රීඩා මාධ්‍ය කතෘවරුන් හා ප්‍රකාශකයින්
- රූපවාහිනි හා ගුවන්විදුලි ක්‍රීඩා වැඩසටහන් නිෂ්පාදකයින්

## 4.PESTEL විශ්ලේෂණය

**දේශපාලනික(Political)**

1.දේශපාලනික දැක්ම ප්‍රමාණවත් වේ

2.උප ජාතික මට්ටමේ දේශපාලනඥයන් අතර විෂය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නැත.

3.සමබර/ ගතික ක්‍රීඩා ප්‍රතිපත්තියක්.

4.ක්‍රීඩා සංගම් /ක්‍රීඩකයින් දේශපාලකයින් ජනතාව අතර අන්තර් සබඳතාවයක් නොමැත.

5.ක්‍රීඩා සංගම්වල සැලසුම් දුර්වලතා.

6.ක්‍රීඩා සංගම්වල ධාරිතාවල දුර්වලතා.

7.ක්‍රීඩාවේ දේශපාලනය.

8.ක්‍රීඩා දෘෂ්ටිවාදයක් නොමැත.

9.ක්‍රීඩාව ජීවිතයෙහි ප්‍රමුඛතා කාර්යයක් ලෙස ගොඩනගා නැත.

10.ක්‍රීඩා සංස්කෘතියක් සඳහා මාධ්‍ය ගොඩනැගී නැත.

**ආර්ථිකමය(Economical)**

1.වැඩසටහන් වල මෙහෙයුම් ඇගැයුම් දුර්වලය.

2.අවස්ථා හඳුනාගෙන නොමැතිවීම.

3.විවිධාංගීකරණය නොවීම.

4.පහසුකම් ප්‍රමාණවත් නොවීම.

5.දුබලතා සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් නොමැති වීම.

6.නවෝත්පාදනයන් ඉදිරිපත්වීම

6.ප්‍රමුඛතා ක්‍රීඩා හඳුනාගෙන නොතිබීම.

I.ක්‍රීඩා සංස්කෘතියක් ගොඩනැගීමේ සැලැස්මක් II. ප්‍රමුඛ ක්‍රීඩා ගොඩනැංවීමේ සැලැස්මක්

7.ක්‍රීඩා සංගම් ආර්ථික වශයෙන් දියුනු නොවීම හා ස්වාධීන නොවීම.

8.ක්‍රීඩා සංගම් අපේක්ෂිත අරමුණු සඳහා ඉලක්කගත නොවීම.

9. රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා ව්‍යපෘති සඳහා ප්‍රවේශවීම අඩුයි(PPP)

10.පුද්ගලික අංශයේ CSR ව්‍යපෘති මෙහෙයුම් හා ඇගයුම් නොවීම(monitoring)

11.දේපල රජයට හෝ සුභසාධනයට යොමුකිරීමේදී මහජනතාවතුල නව දර්ශනයක් ගොඩනගා නැත

12.ක්‍රීඩා භාණ්ඩ මිල අධිකවීම.

13.ගුණාත්මක ක්‍රීඩා භාණ්ඩ දේශීයව නිෂ්පාදනය නොවීම.(දේශීයව අමුද්‍රව්‍ය සපයාගතහැකි)

14.තහනම් උත්තේජක පරීක්ෂණ සඳහා පහසුකම් නැත

15.දැනුවත් හා ගුණාත්මක පුහුණුකරුවන් පුහුණුකර ගැනීමේජාතික හා අන්තර්ජාතික වැඩපිළිවෙලක් නොමැතිවීම

16.ආහාර සංස්කෘතිය වෙනස්වීම

17.ස්වභාවික ඉහල ප්‍රෝටීන අවශ්‍යතා සපුරාලීමට ඇති අපහසුව

**සමාජීය(Social)**

1.අලසකම සමාජගතවීම.

2.පවුලටම සමාජගතවිය හැකි ස්ථාන අඩුවීම.

3.දරුවන් සඳහා සුරක්ෂිත සමාජයක් නොමැතිවීම.

4.අධ්‍යාපනයේ තරඟකාරීත්වය.

5.සමෝධානිත පුද්ගලයන් ගොඩනැංවීමක් සිදුනොවීම.

6.වටිනාකම්,ආකල්ප හා ප්‍රමුඛතා නොපැවතීම.

7.ප්‍රජාව තුල මෘදු කුසලතා අවමවීම(E/Q)

8.දෙමාපියන් හා ගුරුවරුන් නියමිත කාලයට පෙර ක්‍රීඩකයින් දක්ෂතා අතරට ගෙනඒමේ මානසිකත්වය

**තාක්ෂණික(Technical)**

1. දරුවන් /ක්‍රීඩකයින් පුහුණුකිරීමේදි හා ආහාර සැපයීමේදී තාක්ෂණය අයුතු ලෙස භාවිතා කිරිම.

2.පුහුණු වැඩසටහන් (manuals )පිලිබඳ තාක්ෂණික (monitor) නොවීම

3.skilled based education (sports) අඩුවීම (Professional) නැත

4.ක්‍රීඩා අධ්‍යාපනය/උපාධි වෘත්තීමය නොවීම.

5.ක්‍රීඩාවල නිරතවූ අය සඳහා උසස් අධ්‍යාපන අවස්ථා අඩුවීම

6.උපාධි වලදිහෝ උසස් අධ්‍යපන ආයතන වල ක්‍රීඩා පහසුකම් යටතේ ඇතුලත් වූ අයට ක්‍රීඩාවල නිරත වීමට අවස්ථා නොමැතිවීම

7.නවෝත්පාදන හා ක්‍රීඩා වෛද්‍ය අංශ සඳහා තාක්ෂණික පහසුකම් අවමවීම.

8.දරුවන්ගේ හැකියා හා ලැදියා හඳුනා ගැනිමෙහි පරීක්ෂණ සඳහා ප්‍රවේශ පහසුකම් අඩුවීම.

9.ක්‍රීඩකයින්ගේ දක්ෂතා හා ලැදියා හඳුනාගැනීමේ උපදේශන පරීක්ෂන අඩුවීම.

10.පාසල් ක්‍රීඩා උපදේශකවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම.

11.භූගෝලීය හා කලාපීය වශයෙන් ගැලපෙන වර්ග හඳුනා ගෙන වර්ධනය නොවීම.

**පාරිසරික (Environmental)**

1.ආහාර ද්‍රව්‍යවල පෝෂණ ඌනතාවය.

2.පාරිසරික කලාප අනුව ක්‍රීඩා සඳහා වඩාත් වැඩි විශේෂඥතාවයක් සහිත ක්‍රීඩකයින් තෝරාගැනීම ට යොමු නොවීම.

3.සමාජ ජීව විද්‍යාත්මක සාධක අනුව ක්‍රීඩා වර්ගීකරණය.

4.ජාතීන් හා ආගමික ජන කණ්ඩායම් අනුව ගැළපෙන ක්‍රීඩාවන් හඳුනා ගැනීම.

5.ජාත්‍යන්තර තරඟකාරී තරග අඩුවීම.

6.ක්‍රීඩයින් පිලිබඳ දත්ත පද්ධතියක් නොමැතිවීම.

7.ජාතික සංවාදයක් නොමැතිවීම(අධ්‍යපන හා ක්‍රීඩා විචාරාත්මක)

**නෛතික (Legal)**

1.තහනම් උත්තේජක භාවිතයෙන් පිළිබඳ පරීක්ෂණ සඳහා දේශීය පහසුකම් අඩුයි

2.අන්තර්ජාතික සහයෝගයන් උපරිමයන් ලබානොගැනීම.

3.ක්‍රීඩා සංගම් වල උපායමාර්ගික සැලසුම් නැතිවීම/දුර්වල වීම.

4.ප්‍රතිපත්තියක් වශයෙන් සංගම්වලට රජයේ දායකත්වයක්ඇතුලත් නොවීම.

5.සියළු ක්‍රීඩා සඳහා පරිපාලන දේහයක් නොවීම(Governing Body)

6.සංගම්වල ප්‍රධානීන්ගේ පෞද්ගලික අවශ්‍යතා ප්‍රමුඛ වීම

7.පුහුණු කරුවන්ගේ ආකල්පමය දුර්වලතා හේතුවෙන් ක්‍රීඩකයින් දක්ෂ පුහුණු කරුවන් සඳහා යොමුනොකිරීම

7.සංගම්වල කළමණාකරුගේ දුර්වලතා

8. සංගම්වලට අදාල පොදු නීති පද්ධතියක් නොවීම.

9.කළමණාකරන උපදේස් නිකුත්කර නොමැතිවීම

10.ක්‍රීඩාමාධ්‍ය සඳහා හැසිරවීමට උපදෙස් ලබා නොදීම(මාධ්‍ය උපමාන)

11.ක්‍රීඩා කුසලතා මගින් උසස් අධ්‍යාපනයට යොමුකරන ක්‍රීඩකයින් ක්‍රීඩා ආයතන වලට අවශ්‍යතාවය අනුව යොමුකිරිමේ නීතිමය හැකියාව නොමැතිවීම.

## 5. ගැටළු හා යෝජනා

**1.ක්‍රීඩාවේ අරමුණු සඳහා සමාජ හා සම්මේලන නියාමනය**

ක්‍රීඩා සංගම් ක්‍රීඩාවේ සංවර්ධනය කිරීම යන ප්‍රධාන අරමුණට බාහිරව වෙනත් අරමුනු කෙරෙහි ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වේ. ක්‍රීඩකයන්ගේ අභ්‍යන්තර දේශපාලනයක් ගොඩනැගී ඇත.මෙම තත්ත්වයන් පාලනයකර සියළුම හැකියාවන් කෙරෙහි /ක්‍රීඩාවේ සංවර්ධනයට යොමුකරමින් පොදු ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් සකස්කර ක්‍රියාත්මක කල යුතුයැයි යෝජනා කර සිටිනු ලැබේ.

**2.ආයතන අතර සම්බන්ධීකරණය**

ක්‍රීඩා සංවර්ධනය සඳහා පළාත් සභා හා පලාත් පාලන හා ජාතික මට්ටම් අතර සම්බන්ධීකරනය දුර්වල මට්ටමක පවතීයැයි නිරීක්ෂනය වේ. මේ සඳහා සංවාදයක් ගොඩනැගිම හා එමගින් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සුදුසු යැයි නිරීක්ෂනය කෙරේ.

පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රය , ජාතික හා සංගම් පාදක කොට පැවැත්වෙන ක්‍රිඩා ක්ෂේත්‍රය අතර දුර්වල වයක් පවතී. එබැවින් පාසල් ක්ෂේත්‍රය සමග ඒකාබද්ධව ගමන් කරන්නා වූ ප්‍රවේශයක් සඳහා යා යුතුයැයි නිරීක්ෂණය වේ.

**3.සමාජ හා ආර්ථික ප්‍රගමනය උදෙසා ක්‍රීඩාවේ දායකත්වය පිලිබඳව අධ්‍යාපනය පුළුල් කිරීම**

වර්තමානයේ සමාජ හා ආර්ථික ප්‍රගමනය සඳහා ක්‍රීඩාවේ දායකත්වය පිළිබඳව හැදෑරීම යෝග්‍ය වන බව නිරීක්ෂණය වේ.මේ යටතේ සියළුම පාර්ශව කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම නිර්ණායක පදනම් කරගත් පාසල් හා ක්‍රිඩා සංගම් තක්සේරු කරණය ඇගයිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පාසල් ක්‍රීඩාව අනුව වර්ගීකරනය කිරිම)

පුහුණු කරුවන් සඳහා සාකල්‍ය පුහුණු (TOT) ලබාදීම.

දේශීය ක්‍රීඩාව හා ඒ හා ආශ්‍රිත නිෂ්පාදන ආර්ථිකය විද්‍යාත්මකව හඳුනා ගතයුතුව පවතී.

**6.ක්‍රීඩාව පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීම**

ක්‍රිඩකයන් පිලිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීම.එසේම ක්‍රීඩා උපකරන සපයන්නන් ,ක්‍රීඩා සමාජ හා සම්මේලන හා ක්‍රීඩාව සඳහා ඍජු හා වක්‍රලෙස පහසුකම් සපයන්නන් පිළිබඳ පුළුල් දත්ත පද්ධතියක් සකස් කොට යාවත්කාලීනව පවත්වා ගැනීම.

**7.සාමාජීය වටිනාකම් පිළිබඳ දැනුවත් කිරීම**

ක්‍රීඩාවේ සමාජමය වටිනාකම් පිළිබඳව සමාජ දැනුවත් භාවය අවම මට්ටමක පවතී. මෙහිදී කුටම්භ වශයෙන් රැස්වී කායික මානසික අධ්‍යාත්මික සමාජ සුවතා සලසා ගැනීමෙහි අවස්ථා හඳුනා ගැනීම හා ප්‍රචලිත කිරීම සිදුකල යුතු යැයි නිරීක්ෂණය වේ.මේ සඳහා පොදු ස්ථාන වල පහසුකම් සැපයිය යුතුය

**8.පාසල් සඳහා ශරීර සුවතාවය වැඩසටහන් නැවත හඳුන්වා දීම**

වර්තමාන සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුල ශාරීරික ක්‍රියාකාරකම් සඳහා යෙදී ඇති අවස්ථාවන් අල්ප වේ. එබැවින් ක්‍රීඩාවෙන් සමෝධානිත පුරවැසියකු බිහිකිරීම සඳහා පාසල් වලට ශරීර සුවතා වැඩසටහන් හඳුන්වා දීම.

**9.ක්‍රීඩා සාහිත්‍යය ප්‍රචලිත කිරීම**

වර්තමානයේ ක්‍රීඩාවේ සාහිත්‍ය කෙරෙහි පුවත්පත් වල, සමාජ ජාලා හා පාඨකයන්ගේ අවධානය යොමුකිරීම සඳහා ක්‍රමවත් වැඩ පිලිවෙලක් යෙදිය යුතු යැයි නිරීක්ෂණය වේ.

**10. නවීන තාක්ෂණික උපකරණ සඳහා පහසුකම් සැපයීම**

ක්‍රීඩකයින් ට නිසි පරිදි පුහුණු කිරීම සඳහා අවශ්‍ය වලන හඳුනා ගැනිම වැනි අධි තාක්ෂණ උපකරණ ශ්‍රී ලංකාව තුල නොමැතිවීම. ඉරියවු නිවැරදි කරගැනීමට මේවා අත්‍යවශ්‍ය වේ.එමගින් ඉහල තාක්ෂණයකින් යුතු ක්‍රීඩකයන් බිහිකලහැකි වනු අතර ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බිහිකිරිම සඳහා ඉහත පුහුණු උපකරණ වැදගත් කාර්යයක් ඉටුකරයි.

**11.පෝෂණ අතිරේක ආනයනය මත රැඳී පැවතීම**

ආහාර අතිරේක සඳහා විශාල විදේශ විනිමයක් වැයවීම හා ඒවා දේශීයව නිෂ්පාදනය නොවීම. ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදන ආයතන වලට මෙම තාක්ෂණය ලබාගෙන නිෂ්පාදනයෙන් විදේශ විනිමය ඉතිරිකර ගත හැක.

**12.ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් හිඟතාවය**

ක්‍රිඩා වෛද්‍ය අංශය සැලකූ විට ක්‍රීඩා වෛද්‍යවරුන්/ක්‍රීඩා වෛද්‍ය විශේෂඥයින්ගේ සැලකිය යුතු හිඟතාවයක් පාසල් මට්ටම, ක්‍රීඩා සංගම් හා ජාතික මට්ටමේ යන ක්ෂේත්‍රයන්ගේ පවතී. ඒ අනුව ක්‍රීඩා වෛද්‍යවරුන් සඳහා සැලකියයුතු හිඟයක් මේවනවිට පවතී. ඒ අඩුව පිරවීම සඳහා විශ්වවිද්‍යාල තුල ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පාඨමාලා ඇරඹීම හා ඒ පිළිබඳ පර්යේෂණ ආරම්භ කලයුතුය.

**13.ක්‍රීඩා මනෝවිද්‍යාව හා ක්‍රීඩා මනෝවෛද්‍ය උපදේශකයින්ගේ හිඟතාවය**

එසේම ක්‍රීඩා කණ්ඩායම් සඳහා ක්‍රීඩා මනෝ විද්‍යාව පුහුණුවලත් විශේෂඥයන්ගේ අතිශය හිඟයක් පවතී. ක්‍රීඩකයින්ගේ මානසික මට්ටම, තරඟයකට ඒකාග්‍රතාවයකින් යුතුව මුහුණ දීමට මෙය අත්‍යවශ්‍ය සේවාවකි. එමගින් සිදුකරන දීර්ඝ කාලීන උපදේශනය මගින් ක්‍රීඩකයන් අන්තර් ජාතික මට්ටම කරා සංවර්ධනය කලහැකි වේ. මෙය ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේම අනු අංශයකි. මේ මගින් පාසල් සංගම් හා ජාතික හා අන්තර්ජාතික මට්ටම සඳහා පුහුණු ක්‍රීඩා චිකිත්සකයන් හා උපදේශකවරුන් සංවිධානාත්මකව පුහුණු කල හැකිය.මේ සඳහා ක්‍රීඩා වෛද්‍ය ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය , ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, වෛද්‍ය පර්යේෂණ ආයතනය වැනි ආයතන ඒකාබද්ධව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒමගින් අදාල වෘත්තිකයන් රටට බිහිකිරීම මගින් අවශ්‍යතාවය මත විවිධ මට්ටමේ ක්‍රීඩකයන් සඳහා සේවය සපයන ආයතන එනම් ව්‍යවසායකයන් බිහිකලහැකිය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ කිරීම හා අධ්‍යයන කරන්නන්ගේ හිඟයක් ද අපරට තුල වර්තමානයේ පවතී.

දේශීය ක්‍රීඩා පර්යේෂණ වෘත්තිකයන්ද දේශීය පදනමක් සහිත ක්‍රීඩාවක් ගොඩනැගීමට අත්‍යාවශ්‍ය කාරණයකි. එබැවින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතියට මෙන්ම රටේ රැකියා ප්‍රශ්නයටද විසඳුම් සැපයිය හැකි ක්ෂේත්‍රයක් වන ක්‍රීඩා වෛද්‍ය අංශය හා එහි අනු අංශයන් කෙරෙහි නිසි අවධානය යොමුවීම අත්‍යාවශ්‍යය.

## 14.ක්‍රීඩාවේ පුළුල් ලෙස විද්‍යාත්මක මට්ටමින් භාවිතා කලහැකි දේශීය පෝෂණ අතිරේක භාවිතය සඳහා යොමුවීම

වර්තමානයේ භාවිතා කරන්නාවූ ප්‍රචලිත පෝෂණ අතිරේකයන් වෙනුවට ආදේශක ලෙස භාවිතා කලහැකි දේශීය නිෂ්පාදන පිළිබඳ පර්යේෂන ආයතන හා විශ්ව විද්‍යාල විසින් ආරම්භ කලයුතු යැයි නිරීක්ෂණය වේ. එසේ හඳුනා ගන්නා ලද හා වෛද්‍ය විද්‍යාත්මක ක්ෂේත්‍ර පර්යේෂණ මගින් තහවුරු කරන ලද නිෂ්පාදන දේශීය නිෂ්පාදන ව්‍යවසායකයන් ලවා නිෂ්පාදනය කර අවම මිල යටතේ දේශීය වෙළඳ පලට ඉදිරිපත් කලහැකිය.එසේම මෙම නිෂ්පාදනයන් විදේශ රටවලට අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමේ විභව තාවයක් පවතින බව නිරීක්ෂනය වේ. එසේම මෙම සමස්ථ ක්‍රියාවලිය මගින් විදේශ ආහාර අතිරේක ආනයනයට වැයවන විදේශ විනිමය අවම කරගත හැකිවන බව දැක්විය හැකිය.

## 15.දේශීය වෛද්‍ය විද්‍යාවෙහි සහය -ඖෂධ හා පෝෂණ අතිරේක සඳහා යොමුවීම

ඉහතින් දැක්වූ පරිදිම දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය දැනුම හා ඖෂධ යොදාගනිමින් වර්තමාන ආහාර අතිරේකයන්ට සමගාමී හා අතුරු ආබාධ රහිත නිෂ්පාදන සකස් කරගැනීමේ හැකියාව පවතින බව එදින සාකච්ඡාවේදී සඳහන් විය.ඒ අනුව ඒ පිළිබඳව ආයුර්වේද දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය හා අනිකුත් ආහාර තාක්ෂණ පීඨයන් සහිත විශ්ව විද්‍යාලයන් හා වෛද්‍ය පීඨයන් පර්යේෂණ ආරම්භ කලයුතු යැයි මෙහිදී යෝජනා කර සිටිනු ලැබේ. එසේ හඳුනා ගන්නා ලද හා වෛද්‍ය විද්‍යාත්මක ක්ෂේත්‍ර පර්යේෂණ මගින් තහවුරු කරන ලද නිෂ්පාදන දේශීය නිෂ්පාදන ව්‍යවසායකයන් ලවා නිෂ්පාදනය කර අවම මිල යටතේ දේශීය වෙළඳ පලට ඉදිරිපත් කලහැකිය.එසේම මෙම නිෂ්පාදනයන් විදේශ රටවලට අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමේ විභවතාවයක් පවතින බව නිරීක්ෂනය වේ. එසේම මෙම සමස්ථ ක්‍රියාවලිය මගින් විදේශ ආහාර අතිරේක ආනයනයට වැයවන විදේශ විනිමය අවම කරගතහැකිවන බව දැක්විය හැකිය.

## 16.ක්‍රීඩා පෝෂණවේදය හා අදාල ක්ෂේත්‍රයේ මානව සම්පත් හිඟය

ක්‍රීඩකයින් ක්‍රීඩා කිරීමේදි සැලකිය යුතු පෝෂණවේදය පිළිබඳ දැනුමැති විශේෂඥයන් අවශ්‍යවේ.ක්‍රීඩකයන්ගේ ජෛව විද්‍යාත්මක වයස, නිරතවන ඉසව්ව හා ඉසව්වන් හා ක්‍රීඩා කරන දේශගුණයන් හා උන්නතාංශ අනුව අවශ්‍ය පෝෂණය විවිධ වේ.ඒ අනුව ක්‍රීඩකයන් සඳහා උපදෙස් ලබා දියහැකි පෝෂණවේදීන් ගේ හිගයක් වර්තමානයේ නිරීක්ෂණය වේ. ඒ අනුව අදාල පාඨමාලා විශ්වවිද්‍යාල මගින් ක්‍රියාත්මක කරන්නේ නම් පාසල් ජාතික හා අන්තර්ජාතික මට්ටම දක්වාවූ ක්‍රීඩාව සංවර්ධනයට මගපෑදේ. මෙම පෝෂණවේදීන් හට පෞද්ගලික ආයතන වශයෙන් හෝ

ව්‍යවසායකයන් වශයෙන් රැකියා අවස්ථා ජනිත කල හැකිය. මෙම පෝෂණ වේදය ද ඉහතින් සඳහන් ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ අනු අංශයකි.

## 17.ක්‍රිඩාවේ පුළුල් ලෙස විද්‍යාත්මක නොවන මට්ටමින් පෝෂණ අතිරේක භාවිතය

වර්තමානයේ විශේෂයෙන් පාසල් ක්‍රීඩාවේ සිටම පෝෂණ අතිරේක භාවිතය සිදුවේ. වර්තමානයේ එය කෙටිකාලීන ප්‍රතිපල ඉලක්ක කොටගත් විද්‍යාත්මක නොවන භාවිතයක් ලෙස හැඳින්විය හැකිය. දෙමව්පියන් පවා කෙටිකාලීන අරමුනු වෙනුවෙන් ක්‍රීඩකයන් හට ඇතිවිය හැකි අතුරු විපාක නොසලකා යොදාගැනීමට අනුබලදීම කණගාටුවට කාරණයකි. මේ පිලිබඳව ක්රීඩා වෛද්‍ය විශේෂඥයන්ගේ හා පෝෂණවේදින් ගේ සහය අත්‍යවශ්‍යය. මෙම තත්ත්වය අධ්‍යපන බලධාරීන් හා අදාල සියළුම ක්‍රීඩා හා සෞඛ්‍ය බලධාරීන් නියාමනය කලයුතුයැයි යෝජනා කර සිටිනු ලැබේ.

## 18.තහනම් ශරීර උත්තේජක භාවිතය හා නියාමනය

තහනම් ශරීර උත්තේජක භාවිතය පිළිබඳව ගැටළු පැවතීම, දැනුවත් බව නොමැතිවීම . ශ්‍රී ලංකාවේ ක්‍රමවත් පරීක්ෂණ සිදුකරගතැකි වීමේ විද්‍යාගාර පහසුකම් සීමිත වීම.

6. උපායමාර්ග හා යෝජිත කාර්යයන්

| උපායමාර්ග | කාර්යයන් | වගකීම දරන ආයතන | සම්බන්ධ කරගත හැකි අනිකුත් ආයතන |
|---|---|---|---|
| **1.දේශපාලන** | | | |
| 1.1ජාතික මට්ටම හා පලාත් හා පළාත් පාලන ආයතන සමග සම්බන්ධීකරනය | 1.ජාතික මට්ටම හා පළාත් හා පළාත් පාලන ආයතන අතර සංවාදයක් ගොඩනැගීම. | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1.අධ්‍යාපන අමාත්‍යාංශය<br>2.පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යාපන කාර්යාල<br>3.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම්<br>4.ත්‍රිවිධ හමුදාව<br>5.ජාතික විශ්වවිද්‍යාල |
| 1.2 ක්‍රීඩා සංගම් ජාතික ප්‍රතිපත්තියට අනුගතවන පරිදි නියාමනය සඳහා වූ වැඩපිලිවෙලක් සැකසීම | 1.මාර්ගෝපදේශයක් සැකසිම හා නියාමනය කිරිම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම් |
| 1.3සමාජ හා ආර්ථික ප්‍රගමනය උදෙසා ක්‍රීඩාවේ දායකත්වය පිලිබඳව අධ්‍යාපනය පුළුල් කිරීම. | 1.දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරිම<br><br>2.නිර්නායක පදනම් කරගෙන තක්සේරුකරන වැඩසටහන් හා ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම(පාසල් ක්‍රීඩාව අනුව වර්ගීකරනය කිරීම)<br>3.පුහුණු කරුවන් සඳහා සාකල්‍ය පුහුණුවක් ලබාදීම. දැනුම,ආකල්ප,කුසලතා හා සමාජ කුසලතා | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.අධ්‍යාපන අමාත්‍යාංශය<br>4.පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යාපන කාර්යාල<br>5.ජාතික විශ්වවිද්‍යාල | 1.අධ්‍යාපන අමාත්‍යාංශය<br>2.පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යාපන කාර්යාල<br>3.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම්<br>4.ත්‍රිවිධ හමුදාව<br>5.ජාතික තරුණ සේවා සභාව |

| 2.ආර්ථික | | | |
|---|---|---|---|
| 2.1 ජාතික ආර්ථිකයට ක්‍රීඩාවේ දායකත්වය කෙසේවිය යුතුද යන්න හැඳුන්වාදීම | ඒ සම්බන්ධව අවස්ථා හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සිදුකිරීම<br>1.Tomato Festival in Japan<br>2.sport Day | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>4.ජාතික විශ්වවිද්‍යාල<br>5.ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 1.ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය(IPS)<br>2.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම් |
| 2.2 ක්‍රීඩාවට ප්‍රවේශය සඳහා වූ ආර්ථික බාධාවන් අවම කිරීම | පෞද්ගලික අංශයේ සමාජ සංවිධාන(CSR) දායකත්වයන් හඳුනාගත් ක්‍රීඩාවන්ගේ ආර්ථික බධාවන් අවම කිරිමේ දෙසට යොමුකිරීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.ත්‍රිවිධ හමුදාව<br>4.හාම්පුතුන්ගේ සම්මේලනය (EFC) | 1.අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br>2.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම්<br>3.අනුග්‍රාහක ආයතනයං<br>4.ක්‍රීඩා විෂයභාර පළාත් අමාත්‍යාංශ |
| 2.3 ක්‍රීඩාව ආශ්‍රිත නිෂ්පාදන ආර්ථිකය විද්‍යාත්මකව හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය | 1.ක්‍රීඩාව සම්බන්ධ නිෂ්පාදන ආයතනයන් පිලිබඳ ජාතික දත්ත පද්ධතියක් සකස්කිරීම<br><br>2.ක්‍රීඩාව ආශ්‍රිත නිෂ්පාදනවල ගුණත්වය ප්‍රවර්ධනය සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම<br><br>3.ක්‍රීඩාව සම්බන්ධ රැකියා පිලිබඳ වෘත්තීය මාර්ගෝපදේශනය දී දැනුවත් කිරීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>3.ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>4.ජාතික විශ්වවිද්‍යාල<br>5.ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 1.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම්<br>2.කර්මාන්ත අමාත්‍යාංශය<br>3.ආයෝජන මණ්ඩලය<br>4.දේශිය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද වෛද්‍ය සභාව<br>5.කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය |

| | | | |
|---|---|---|---|
| **3.සාමාජීය** | | | |
| 3.1ක්‍රීඩාවේ සමාජමය වටිනාකම් පිලිබඳව දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම | 1.කුටුම්භ වශයෙන් රැස්වී කායික,මානසික,අධ්‍යාත්මික හා සමාජීය සුවතා සලසා ගැනීමේ විවෘත ස්ථාන හඳුනා ගැනීම. | 1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය<br>3. පළාත් අධ්‍යපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යපන කාර්යාල<br>4. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>5.සියළුම පලාත්සභා | 1.ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>2.රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනි නාලිකා<br>3 රාජ්‍ය හා පෞද්ගලික ගුවන්විදුලි නාලිකා<br>4.පුවත්පත් හා සමාජජාල<br>5.තරුණ සේවා සභාව<br>6.යොවුන් සේනාංකය |
| 3.2 ක්‍රීඩාව තුලින් සමෝධානිත පුරවැසියකු බිහිකිරීම | 1.පාසල්වල දෛනික ශරීර සුවතා වැඩසටහන් යලි ක්‍රියාත්මක කිරීම | 1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය<br>3. පළාත් අධ්‍යපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යපන කාර්යාල<br>4. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>5.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 1.ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>2.රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනි නාලිකා<br>3 රාජ්‍ය හා පෞද්ගලික ගුවන්විදුලි නාලිකා<br>4.පුවත්පත් හා සමාජජාල.<br>5.සෞඛ්‍ය අමාත්‍යාංශය<br>6.ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>7.තරුණ සේවා සභාව |
| 3.3ක්‍රීඩා සාහිත්‍යයක් ගොඩනැගීම | 1.සාහිත්‍ය නිර්මාන තුල ක්‍රීඩාවේ අගයන් විද්‍යාමාන කිරීමට සාහිත්‍ය නිර්මාන ශිල්පීන් දිරිගැන්වීම<br><br>2.පාසල් පෙළපොත් වලට ක්‍රීඩාවේ අගයන් නිරූපනය වන පාඩම් එකතුකිරීමට කටයුතු යෙදීම<br><br>3.ක්‍රීඩාවේ වටිනාකම් නිරූපනය වන චිත්‍ර,රචනා පෝස්ටර් වැනි තරග සංවිධානය සහ ප්‍රදර්ශන පැවැත්වීම | 1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය<br>3. පළාත් අධ්‍යපන අමාත්‍යාංශය හා කලාප අධ්‍යපන කාර්යාල<br>4. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>5.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>6.ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>7.තරුණ සේවා සභාව | 1.රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනි නාලිකා<br>2 රාජ්‍ය හා පෞද්ගලික ගුවන්විදුලි නාලිකා<br>3.පුවත්පත් හා සමාජජාල<br>4.ජාතික විශ්වවිද්‍යාල<br>5.සියළුම ක්‍රීඩා සම්මේලන හා සංගම් |

| | | | |
|---|---|---|---|
| **4.තාක්ෂනික** | | | |
| 4.1තාක්ෂනික ක්‍රිඩා භාවිතය, සමාජ හා ආර්ථික සංදර්භයන් නිපුණ මානව සම්පතක් නිර්මානය කිරීම උදෙසා නියාමණය කිරීම | 1.ක්‍රිඩකයාගේ ජාතික හා ජාත්‍යන්තර දක්ෂතාවයන්ට ගැලපෙන පරිදි NVQ මට්ටමෙහි පිලිගැනීම ලබාදීම<br>2.ක්‍රිඩාව සම්බන්ධ උපකරණ නිපදවන නවෝත්පාදකයින් හා ආයෝජකයින් අතර සම්බන්ධීකරන වැඩසටහන් සම්පාදනය<br><br>3ක්‍රිඩාව සම්බන්ධ උපකරණ නිපදවන නවෝත්පාදකයින් හා ආයෝජකයින් අතර සම්බන්ධීකරණ වැඩසටහන් සම්පාදනය<br><br>4.ආයුර්වේදය හා දේශීය වෙදකම පදනම් කරගෙන නිපදවන ක්‍රිඩා ආධාරක හා ඖෂධීය ගුණසහිත වෙළුම් පටි, කඩිනමින් ආබාධ සඳහා සුවය ලබා දෙන සංයෝග නිෂ්පාදනය දිරිගැන්වීම<br><br>5.ක්‍රිඩකයන්ගේ කුසලතා ප්‍රවර්ධනය සඳහාත් විවිධ පරීක්ෂණ සිදුකිරීම සඳහාත් අත්‍යවශ්‍ය තාක්ෂනික උපකරන හා ක්‍රමවේදවල වැදගත්කම පෙන්වාදීම(මිලදී ගැනීමට/නිපදවීමට)<br><br>6.ආනයනික පෝෂණ අතිරේකයන්ට දේශීයවශයෙන් නිපදවා ඇති පෝෂණ අතිරේකයන් භාවිතයේ යෝග්‍යතාවය උදෙසා පරීක්ෂණාත්මකව යොමුවීම.(විශේෂයෙන් දෙශීය වෛද්‍ය තාක්ෂණයෙන් නිපදවිය හැකි) | 1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය<br>3.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>4.ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>5.ජාතික විශ්වවිද්‍යාල<br>6.කර්මාන්ත අමාත්‍යාංශය<br>7.සෞඛ්‍ය අමාත්‍යාංශය<br>8.ක්‍රීඩා වෛද්‍ය ආයතනය<br>9.ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | 1.තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව(TVEC)<br>2.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය(BOI)<br>3.කාර්මික සංවර්ධන මණ්ඩලය(IDB)<br>4.පුවත්පත් හා සමාජජාල<br>5.රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනි නාලිකා<br>6.රාජ්‍ය හා පෞද්ගලික ගුවන්විදුලි නාලිකා<br>7.ව්‍යාපාරික වශයෙන් ආහාර හා ඖෂධ අතිරේක නිෂ්පාදන සමාගම්<br>8.ක්‍රීඩා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය |
| 4.2 හැකියා ලැදියා පර්යේෂන මත වෘත්තීය විභවතාවයන් සහිත ක්‍රිඩකයන් හඳුනා ගැනීම | 1.මනෝමිතික පරීක්ෂණ පැවැත්වීම.(වෘත්තීය යතුර පරීක්ෂණය) | 1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br>3.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 1.නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය<br><br>2. you lead ආයතනය<br><br>3.Carrier ME ආයතනය<br><br>4.ILO ආයතනය |
| **5.පාරිසරික** | | | |

| | | | |
|---|---|---|---|
| 5.1 ක්‍රීඩාවට වඩාත්යෝග්‍ය වූ හෙල ආහාර සංස්කෘතියක් උදෙසා යොමුවීම | 1.දේශීය ආහාර ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(පාසල්,රාජ්‍ය ආයතන,විශ්ව විද්‍යාල,ග්‍රාමීය සංවාධාන) | 1.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>2.ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තු<br>3.සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය<br>4.දේශිය වෛද්‍ය විශ්ව විද්‍යාල<br>5.ආයුර්වේද වෛද්‍ය සභාව<br>6.ජාතික ක්‍රීඩා විද්‍යායතනය<br>7.ක්‍රීඩා වෛද්‍යායතනය | 1.කෘෂිකර්ම අමාත්‍යාංශය<br>2.විෂය ප්‍රමාණික දැනුම් සහිත සම්පත් දායකයින්(Subject Specialist)<br>3.සියළුම ජනමාධ්‍ය හා සමාජජාලා<br>4.අධ්‍යාපන අමාත්‍යාංශය<br>5.සංචාරක අමාත්‍යාංශය<br>6.කර්මාන්ත අමාත්‍යශය<br>7.ශ්‍රීලංකා ක්‍රීඩා වෛද්‍ය සංගමය |
| 5.2 භූගෝලීය හා සමාජීය විෂමතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රවර්ධනය කලයුතු ක්‍රීඩා හඳුනා ගැනීම | 1.සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීමෙන්<br><br>2.ක්‍රීඩකයින් පිලිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතිය සකසා යාවත්කාලිනව පවත්වා ගැනීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.ක්‍රීඩා සංගම් හා සම්මේලන<br>4. ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 1.මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>2. අධ්‍යාපන අමාත්‍යාංශය<br>3.පලාත් අධ්‍යපන අමාත්‍යාංශයන් හා කලාප අධ්‍යාපන නාර්යාල<br>4.ක්‍රීඩා විෂය භාර පළාත් අමාත්‍යාංශයන් |
| **6.නෛතික** | | | |

| | | | |
|---|---|---|---|
| 6.1ක්‍රීඩාවේ ප්‍රවර්ධනය උදෙසා නෛතික රාමුවක් හා නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | 1.ක්‍රීඩා පනත සංශෝධනය කිරීම<br><br>2.අන්තර් ජාතික ආයතන /වෙනත් රාජ්‍යයන් සමග අවබෝධතා ගිවිසුම් වලට එළඹීම<br><br>3.සමස්ථ ක්‍රීඩා නියාමන සඳහා ස්වාධීන නියාමන මන්ඩලයක් පත්කිරීම<br>4.ක්‍රීඩා සංගම් පෙඩරේෂන නියාමනය සඳහා නෛතික රාමුවක් ස්ථාපනය කිරීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3. ක්‍රීඩා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය | 1.ක්‍රීඩා විෂය භාර පළාත් අමාත්‍යංශයන් |
| 6.2 ක්‍රීඩා නිතිරීති රෙගුලාසි ආචාර ධර්ම පිලිබඳ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනුම ප්‍රවර්ධනය කිරීම | 1.දැනුවත් කිරීමේ වැඩසටහන්,අත්පත්‍රිකා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.ක්‍රීඩා සංගම් හා සම්මේලන<br>4.ක්‍රීඩා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය<br>5.ජාතික ක්‍රීඩා විද්‍යායතන | 1.ජනමාධ්‍ය<br>2.අධ්‍යපන අමාත්‍යංශය<br>3.පළාත් අධ්‍යාපන අමාත්‍යංශය<br>4.ජාතික තරුණ සේවා සභාව<br>5.යොවුන් සේනාංකය |
| 6.3 වෘත්තීය ක්‍රීඩකයින් ගේ ආර්ථික හා සමාජ/සෞඛ්‍ය සුරක්ෂිතතාව තහවුරු කිරීම | 1.වෘත්තීය ක්‍රීඩකයකුට ප්‍රමාණවත් වෘත්තීය ගෙවීමක් හා රක්ෂණ ආවරනයක් සැපයීම<br><br>2.වෘත්තීය ක්‍රීඩකයකුට ජීවිතයේ සැඳෑසමය සුරක්ෂිතව ගතකිරීමට විශ්‍රාම සැලසුම් ක්‍රමයක් සැකසීම සඳහා නෛතික රාමුවක් ස්ථාපනය කිරීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.ක්‍රීඩා සංගම් හා සම්මේලන | 1.හාම්පුතුන්ගේ සංගමය<br>2.රාජ්‍ය හා පෞද්ගලික රක්ෂන ආයතන<br>3.ක්‍රීඩා වෛද්‍ය සංගමය |
| 6.4වෘත්තීය ක්‍රීඩකයන්ගේ අධ්‍යපනික හා රැකියා සුරක්ෂිත තාවය ස්ථාපනය කිරීම | 1.චක්‍රලේඛ මගින් අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම<br><br>2.ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය පිලියෙල කිරීමේදි ක්‍රීඩාවට ප්‍රමුඛතාවය ලබාදීම | 1.තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය<br>2.ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3.ජාතික ක්‍රීඩා විද්‍යායතන<br>4.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 1.ජාතික විශ්වවිද්‍යාල<br>2.ක්‍රීඩා සංගම් හා සම්මේලන<br>3. ක්‍රීඩා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය |

## <u>සුසංවේද - 2021 විද්වත් කමිටුව</u>

01. ආචාර්ය සුනිල් රණසිංහ මහතා
    මානව විද්‍යාඥ

02. ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලය

03. ආචාර්ය ජයන්ත වත්තෙවිදාන මහතා
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

04. ආචාර්ය මොහොමඩ් මහීෂ් මහතා - මාර්ගගත ක්‍රමය යටතේ සම්බන්ධ විය
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කොළඹ විශ්වවිද්‍යාලය

05. ආචාර්ය සිතුමිණි රත්නමලල මහතා
    ජ්‍යෙෂ්ඨ  කථිකාචාර්ය සමෝධායන අධ්‍යයන අංශය -මොරටුව විශ්වවිද්‍යාල

## රාජ්‍ය අංශය නියෝජනය කරුණු ලබන නිලධාරීන්

සුමිත් බී. පෙරේරා මහතා - අධ්‍යක්ෂ ( සැලසුම්) - බස්නාහිර පළාත් සභාව

ජීවන්ත කීර්තිනායක මහතා - ගණකාධිකාරි - සූර්ය බල සුළං හා ජල විදුලි ජනක ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

විකුම් සම්පත් ගමගේ මහතා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් අංශය)

## සහභාගීත්වය

1. විමල් ලියනගම මහතා - අධ්‍යක්ෂ(සංවර්ධන) - තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
2. එම්.ජී.ටී.ඩී.ආරියරත්න මහත්මිය - සහකාර ලේකම් - තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
3. ජූඩ් නිලුක්ෂන්  මහතා - අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. කේ.ජී.පී.දමයන්ති  මහත්මිය- නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
5. වෛද්‍ය එස්.පී.කුඹුරේගෙදර මහත්මිය  - ශිල්පීය කොමසාරිස් - ආයුර්වේද දෙපාර්තමේන්තුව
6. සංජීව විජේවර්ධන මහතා - පෞද්ගලික සම්බන්ධීකරණ ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමන්
7. ජනනි අබේසිංහ  මෙනවිය - සහකාර අධ්‍යක්ෂ - ජාතික යොවුන් සේනාංකය
8. කිංස්ලි ගුණතිලක මහතා  - ක්‍රීඩා පුහුණුකරු - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

9. එස්.නාදන් මහතා - පර්යේෂණ සහකාර - මානව සම්පත් සංවර්ධන ජාතික සභාව
10. ඊ.එල්.කේ. දිසානායක මහතා - ILO
11. නිරෝෂන් හපුආරච්චි මහතා - අධ්‍යක්ෂ - සංක්‍රමණ හා මාර්ගෝපදේශ - You Lead ආයතනය
12. ජී.එම්.පද්මසංඛ මහතා - කමිටු සාමාජික - ජාතික කබඩි සංගමය
13. ඊ.ඒ.සී.රත්නායක මහතා - කමිටු සාමාජික - ජාතික කබඩි සංගමය
14. තිලකා ජිනදාස මහත්මිය - හිටපු නෙට්බෝල් ජාතික පුහුණුකරු
15. කාංචනා ද සිල්වා මහත්මිය - ක්‍රීඩිකා
16. සහන් රංවල මහතා - කලාවේදී

දෙපාර්තමේන්තු නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 1 | අනුෂා ගෝකුළ ප්‍රනාන්දු | අධ්‍යක්ෂ ජනරාල් |
| 2 | බී.එච්.සී.ශිරෝමාලී | අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ සහ විදේශ සබඳතා |
| 3 | සිතාරා ජයසේකර | අධ්‍යක්ෂ - රැකියා නිර්මාණ ප්‍රවර්ධන, වෘත්තීය මාර්ගෝපදේශ සහ මහජන රැකියා සේවය |
| 4 | එල්.පී.එල්.ගුණරත්න | නියෝජ්‍ය අධ්‍යක්ෂ - ශ්‍රම වෙළඳපොල තොරතුරු සහ පර්යේෂණ |
| 5 | ඩී.එම්.එස්.ආර්.දිසානායක | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් |
| 6 | ශානිකා මායාදුන්නේ මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - ජාතික මානව සම්පත් ප්‍රතිපත්ති හා රැකීරක්ෂා ප්‍රතිපත්ති |
| 7 | කේ.කේ.ඩී.කේ.එස්.සෝමරත්න | සංවර්ධන නිලධාරී |
| 8 | සම්පත් අබේකෝන් | සංවර්ධන නිලධාරී |
| 9 | කේ.බී.එම්.සී.එන්.විජේවර්ධන | සංවර්ධන නිලධාරී |
| 10 | එම්.බී.අයි.යූ.බණ්ඩාර | සංවර්ධන නිලධාරී |

| | | |
|---|---|---|
| 11 | පී.ඩබ්.සී.චන්ද්‍රසේන | සංවර්ධන නිලධාරී |
| 12 | ආර්.එම්.ජේ.එච්.ගජනායක | සංවර්ධන නිලධාරී |
| 13 | ඩී.එම්.එස්.කුමාරි | සංවර්ධන නිලධාරී |
| 14 | එෆ්.ෆ්ලෝරීඩා | සංවර්ධන නිලධාරී |
| 15 | පී.ඒ.කේ.එන්.අතුකෝරල | සංවර්ධන නිලධාරී |
| 16 | එස්.ඒ.එෆ්.සෆ්නා | අභ්‍යාසලාභී උපාධිධාරී |